දික්ර් (දෙවියන් මෙනෙහි කිරීමේ) සභාවන්හි මහිමය පිළිබඳ දන්වන හදීස්.

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව පවසමින් අබූ
හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා මෙසේ වාර්තා කරන ලදී. “සැබැවින්ම අල්ලාහ් සතුව මලක්වරුන් ඇත. ඔවුහු මාර්ගවල සැරිසරමින් දික්ර් වාසීන් ග්රහණය කරති. කීර්තිමත් අල්ලාහ්ව මෙනෙහි කරන පිරිසක් ඔවුන් දුටු විට, ඔවුහු “නුඹලාගේ අවශ්යතා වෙත නුඹලා පැමිණෙනු.” යැයි අමතති. ඔවුන්ගේ පියාපත්වලින් පහළ අහසෙහි ඔවුහු ඔවුන්ව ආවරණය කරති. ඔවුන්ගේ පරමාධිපති -ඔහු දැනුවත්ව සිටිය ද- “මාගේ ගැත්තන් කුමක් පවසන්නේ දැ?”යි ඔවුන්ගෙන් විමසයි. එවිට ඔවුහු: “ඔවුන් ඔබව පිවිතුරු කරති. ඔබව ශ්රේෂ්ඨත්වයට පත් කරති. ඔබට ප්රශංසා කරති. ඔබව කීර්තියට පත් කරති” යැයි පවසති. එවිට ඔහු: “ඔවුහු මා දැක තිබේ ද?” ඔවුහු: “නැත, අල්ලාහ් මත දිවුරා පවසමු. ඔවුහු ඔබව දැක නැත.” යැයි ඔවුහු පවසති. ඔහු: “ඔවුන් මා දුටුවේ නම් කෙසේ වනු ඇත්ද?” යැයි පවසයි. ඔවුහු: “ඔවුන් ඔබව දුටුවේ නම් ඔබට ඉමහත්සේ නැමදුම් කරන්නන් වනු ඇත. ඉමහත්සේ ඔබව කීර්තියට පත් කරනු ඇත. අධික ලෙස ඔබව සුවිශුද්ධ කරනු ඇත. යැයි පවසති. ඔහු: “ඔවුහු කුමක් පතන්නෝද?” යැයි විමසයි. ඔවුහු: “ඔවුන් නුඹගෙන් ස්වර්ගය පතති” යැයි පවසයි. ඔහු: “ඔවුන් එය දැක තිබේද?” යැයි විමසයි. ඔවුහු: “නැත, අල්ලාහ් මත දිවුරා පවසමු. අහෝ පරමාධිපතියාණනි! ඔවුන් එය දැක නැත.” යැයි පවසති. ඔහු: “ඔවුන් එය දැක තිබුණේ කෙසේනම් වනු ඇත්ද?” යැයි විමසයි. ඔවුහු: “සැබැවින්ම ඔවුන් එය දුටුවේ නම් ඒ කෙරෙහි ඔවුහු දැඩි සේ ප්රිය කරනු ඇත. එය දැඩි ලෙස පතනු ඇත. එහි ඒ සම්බන්ධයෙන් දැඩි සේ අපේක්ෂා කරනු ඇත. ඔහු: “ඔවුන් ආරක්ෂාව පතනුයේ කුමකින් ද?” යැයි විමසයි. ඔවුහු: “ඔවුන් ආරක්ෂාව පතනුයේ අපා ගින්නෙනි.” යැයි පවසති. ඔහු: “එය ඔවුන් දැක තිබේද?” යැයි විමසයි. ඔවුහු: “නැත, අල්ලාහ් මත දිවුරා පවසමි. ඔවුන් එය දැක නැත.” යැයි පවසති. ඔහු: “ඔවුන් එය දක තිබුණේ නම් කෙසේ වනු ඇත් ද?” යැයි විමසයි. ඔවුහු: “ඔවුන් එය දැක තිබුණේ නම්, දැඩිසේ එයින් පළා යනු ඇත. ඒ ගැන දැඩිසේ බියවනු ඇත.” යැයි පවසති. ඔහු “සැබැවින්ම ඔවුනට මම සමාව දුන් බවට මම නුඹලාව සාක්ෂි වශයෙන් තබමි” යැයි පවසයි. මලක්වරුන් අතරින් එක් මලක්වරයෙක්: “ඔවුන් අතර මිනිසෙකු වෙයි. නමුත් ඔහු ඔවුන්ගෙන් කෙනෙකු නොවෙයි. සැබැවින්ම ඔහු පැමිණියේ අවශ්යතාවක් උදෙසාය.” යැයි පවසයි. ‘සභිකයින් වන ඔවුනට ඔවුන්ගේ එම සභිගයා අභාග්යයක් වන්නේ නැත.” යැයි පැවසීය. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා විසින් ප්රකාශ කොට අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ තවත් වාර්තාවක: “සැබැවින්ම අල්ලාහ් සතුව ශ්රේෂ්ඨ ගවේශක මලක්වරුන් වෙති. ඔවුහු (අල්ලාහ්ව මෙනෙහි කිරීමේ) දික්ර් සභාවන් ලුහුබැඳ යති. එහි මෙනෙහි කරන සභාවක් ඔවුහු දුටු විට, ඔවුන් සමග වාඩි වෙති. ඔවුන්ගෙන් ඇතැමෙකු ඔවුන් අතර හා පහළ අහස අතර ඇති දෑ ඔවුන් පුරවා දමන තරමට ඔවුන්ගේ පියාපත්වලින් ආවරණය කරති. -අල්ලාහ් දැනුවත් ව සිටියදී පවා- “නුඹලා කොහේ සිට පැමිණෙන්නෙහු දැ?”යි අල්ලාහ් ඔවුන්ගෙන් විමසයි. එවිට ඔවුහු: “ඔබව සුවිශුද්ධ කරමින් ඔබව ශ්රේෂ්ඨත්වයට පත් කරමින් ඔබව ඒකීයත්වයට පත්කරමින් ඔබට ප්රශංසා කරමින් ඔබෙන් ප්රාර්ථනා කරමින් මහපොළොවේ ඔබ වෙනුවෙන් නැමදුම් කරන්නන් වෙතින් අපි පැමිණියෙමු” යැයි පවසති. ඔහු “ඔවුන් මගෙන් කුමක් පතන්නෝ ද?” ඔවුහු: “ඔවුන් ඔබෙන් ඔබේ ස්වර්ගය පතති.” යැයි පවසති. ඔහු: “ඔවුන් මගේ ස්වර්ගය දැක තිබේ ද? ඔවුහු: “නැත, පරමාධිපතියාණනි!” යැයි පවසති. ඔහු: “ඔවුන් මාගේ ස්වර්ගය දැක ඇත්නම්

කෙසේ වේවිද? යැයි විමසයි. ඔවුහු: “ඔවුන් නුඹෙන් ආරක්ෂාව පතනු ඇත.” යැයි පවසති. ඔහු: “ඔවුන් මගෙන් ආරක්ෂාව පතනුයේ කුමකින් ද?” ඔවුහු: “අහෝ පරමාධිපතියාණනි, ඔබේ අපා ගින්නෙනි.” යැයි පවසති. ඔහු: “මාගේ අපා ගින්න ඔවුහු දැක තිබේ ද?” යැයි විමසයි. ඔවුහු: “නැත” යැයි පවසති. ඔහු: “මාගේ අපා ගින්න ඔවුන් දුටුවේ නම් කෙසේ වනු ඇත් ද?” යැයි විමසති. ඔවුහු: “ඔවුන් ඔබෙන් සමාව අයදිනු ඇත.” එවිට ඔහු: “සැබැවින්ම මම ඔවුන් වෙනුවෙන් සමාව දුනිමි. ඔවුන් ඉල්ලන දෑ මම ඔවුනට පිරිනැමුවෙමි. ඔවුන් පතන ප්රතිඵල
වලින් මම ඔවුනට ප්රතිඵල පිරිනැමුවෙමි.” යැයි පැවසීය. ඔවුහු: “ඔවුන් අතර වැරදි කරන ගැත්තෙකු වෙයි. ඔහු ඒ අසළින් ගමන් ගත්තේ නම් ඔවුන් සමග වාඩි වෙයි.” එවිට ඔහු:
“ඔහුටත් මම සමාව දුනිමි. ඔවුන් වනාහි, ඔවුන්ගේ සභිකයා හේතුවෙන් අභාග්යයට පත්
නොවන පිරිසකි.” යැයි පවසයි. [පූර්ව සාධක සහිත හදීසයකි] [බුහාරි හා මුස්ලිම් හි වාර්තා වී ඇත]

දික්ර් මජ්ලිස් ගරුබුහුමන් කිරීමේ කරුණු අතරින් එක් අංගයක් පිළිබඳව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් කළ ප්රකාශය මෙම හදීසයෙහි විස්තර කෙරී ඇත. “සැබැවින්ම අල්ලාහ් සතුව මලක්වරුන් ඇත. ඔවුහු මාර්ගවල සැරිසරමින් දික්ර් වාසීන් ග්රහණය කරති.” එනම්: මලක්වරුන් අතරින් විශේෂිත පිරිසක් ආරක්ෂාවට නොව මහපොළොවේ ගවේශණය කිරීම සඳහා අල්ලාහ් පත් කර ඇත. ඔවුහු මුස්ලිම්වරුන් අතරටත් ඔවුන්ගේ මස්ජිද් අතරටත් ඔවුන්ගේ සම්මන්ත්රණ අතරටත් සැරිසරමින් දික්ර් මජ්ලිස් සොයා යති. ඔවුන් එහි ගොස් එයට සහභාගී වී අදාළ පුද්ගලයින් වෙත සවන් දෙති. අල් හාෆිල් තුමා මෙසේ පැවසීය. එය තස්බීහ් (එනම් අල්ලාහ්ව සුවිශුද්ධ කිරීමේ) මජ්ලිස් වලට හා එවැනි වෙනත් සභාවන්වලට විශේෂයෙන් පැවසූ එකකි. එවිට “කීර්තිමත් අල්ලාහ්ව මෙනෙහි කරන පිරිසක් ඔවුන් දුටු විට” මුස්ලිම්හි එන තවත් වාර්තාවක් අනුව “අල්ලාහ්ව මෙනෙහි කරන සභාවක් ඔවුන් දුටු විට, ඔවුහු “නුඹලාගේ අවශ්යතා වෙත -තවත් වාර්තාවක “නුඹලාගේ කැමැත්ත වෙත”- නුඹලා පැමිණෙනු.” යැයි අමතති. එනම් නුඹලා දික්ර් සභාවන් තුළින් කවර කරුණක් සොයන්නේ ද ඒ වෙත පැමිණෙනු. එයට අදාළ උදවිය හමුවීම පිණිස ඔවුන් වෙත ළඟා වනු. ඔවුන්ගේ මෙනෙහි කිරීම්වලට නුඹලා සවන් දෙනු යන්නයි. සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණන් මලක්වරුන් ගැන ගුණගායනා කරමින් ඔවුහු දික්ර් සභාවන්හි සිට ‘ඔවුන්ව ආවරණය කරති’ යනුවෙන් පැවසීය. එනම් මැණික් කටුවෙහි අත් පළඳනාවෙන් ඔවුන්ව වටකරගෙන සිටිති. “ඔවුන්ගේ පියාපත්වලින් පහළ අහසෙහි ඔවුහු ඔවුන්ව ආවරණය කරති.” එනම් ඔවුන් වටා ඔවුන්ගේ පියාපත් සමග කැරකෙමින් සිටිති. ‘අහසෙහි’ යනු අහසට ළඟා වන තෙක් යන්නයි. පසුව උත්කෘෂ්ට කීර්තිමත් පරමාධිපතියාණන් අතර හා ගෞරවණීය ඔහුගේ මලක්වරුන් අතර සිදුවන කතාබහක් පිළිබඳ සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණන් විස්තර කර සිටියි. උත්තරීතර අල්ලාහ් : “-ඔහු දැනුවත්ව සිටිය ද- “මාගේ ගැත්තන් කුමක් පවසන්නේ දැ?”යි ඔවුන්ගෙන් විමසයි.” එනම් ඔහු ඔවුන්ගේ තත්ත්වයන් පිළිබඳ අධික ලෙස දැන සිටින්නාය. ඔවුන්ගේ කටයුතු පිළිබඳ උත්තරීතර පිරිස ඉදිරියේ වියාචනය කරමින් සිටියි. එය මලක්වරුන් ඔවුන් ගැන අභිමානයෙන් කතා කරනු පිණිස “මාගේ ගැත්තන් කුමක් පවසන්නේ දැ?” විමසයි. එවිට මලක්වරුන් “ඔවුන් ඔබව පිවිතුරු කරති. ඔබව ශ්රේෂ්ඨත්වයට පත් කරති. ඔබට ප්රශංසා කරති. ඔබව කීර්තියට පත් කරති” යැයි පිළිතුරු දෙති. එනම්, එවිට මලක්වරුන් සැබැවින්ම මෙසේ දෙවියන්ව මෙනෙහි කරන්නන් ‘සුබ්හානල්ලා, වල් හම්දුලිල්ලාහ්, වලා ඉලාහ ඉල්ලල්ලාහ්, වල්ලාහු අක්බර්’ (අල්ලාහ් සුවිශුද්ධය, සියලු ප්රශංසා ඔහු සතුය. ඔහු හැර නැමදුමට සුදුසු වෙනත් දෙවියකු නැත, අල්ලාහ් අති ශ්රේෂ්ඨය) යැයි පවසන අතර ඔහුව ‘ලා ඉලාහ ඉල්ලල්ලාහ්’ (නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර වෙනත් දෙවියෙකු නැත) යනුවෙන් කීර්තියට පත් කරති. යැයි පවසති. එහි දේවත්වය ඒකීය කරණය කරමින් උත්තරීතර අල්ලාහ්ට ගරුබුහුමන් දැක්වීමක් අන්තර්ගතව ඇත. පසුව උත්තරීතර අල්ලාහ් “ඔවුහු මා දැක තිබේ ද?” ඔවුහු: “නැත, අල්ලාහ් මත දිවුරා පවසමු. ඔවුහු ඔබව දැක නැත.” යැයි ඔවුහු පවසති. ඔහු: “ඔවුන් මා දුටුවේ නම් කෙසේ වනු ඇත්ද?” යැයි පවසයි. ගෞරවනීය මලක්වරුන් පිළිතුරු දෙමින්: “ඔවුන් ඔබව දුටුවේ නම් ඔබට ඉමහත්සේ නැමදුම් කරන්නන් වනු ඇත. ඉමහත්සේ ඔබව කීර්තියට පත් කරනු ඇත. අධික ලෙස ඔබව සුවිශුද්ධ කරනු ඇත.” යැයි පවසති. ඊට

[illegible]

http://sunnah.global/hadeeth/si/show/8272